ලංකා රෝහලේ වැසිකිළියකින් අත්බෝම්බයක් හමුවීමේ සිදුවීම සැප්තැම්බර් 14, 15, 16 සහ 17 දින වල මාධ්‍ය ඔස්සේ වාර්තා කර තිබිණි.

මෙහිදී, බොහෝ මාධ්‍ය මගින් අදාළ සැකකරුගේ වාර්ගිකත්වය සඳහන් කර නොතිබුණු නමුත්, "ඇතැම් මාධ්‍ය" පමණක් අදාළ සැකකරුගේ වාර්ගිකත්වය "දමිළ" යැයි සඳහන් කර තිබිණි.

යම් කිසි පුවතකට සෘජුව අදාළ නොවන අවස්ථාවක යම් කිසි අයෙකුගේ හෝ කණ්ඩායමකගේ වාර්ගිකත්වය ඉදිරිපත් නොකළ යුතු බව මාධ්‍ය ආචාර ධර්ම පවසයි. බොහෝ විට පුවතට සෘජුව අදාළ නොවන අවස්ථාවන්හිදී වාර්ගිකත්වය ඉස්මතු කෙරෙන්නේ සෘණාත්මක සන්දර්භයන් තුළදී බවද කිව යුතු වේ.

කෙසේ හෝ, ඉහත සිදුවීමේදී අනෙකුත් මාධ්‍ය සැකකරුගේ වාර්ගිකත්වයක් සඳහන් නොකරමින් එය වාර්තා කරන විට, දිවයින සහ මව්බිම පමණක් වාර්ගිකත්වය ඉස්මතු කරන්නේ මන්ද? දිවයින සහ මව්බිම පුවත් සඳහා පමණක් එම වාර්ගිකත්වය අදාළ වන්නේ කෙසේද? පාඨක අප ඇසිය යුතු පැනය එයයි.

මේ පිළිබඳ අපගේ මින් පෙර සඳහන් කිරීම් වලට සබැඳි: **https://www.facebook.com/ethicseye/posts/1509466336075085**
**https://www.facebook.com/.../a.234027673.../1510141112674274**

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima #CeylonToday #Divaina #Lankadeepa #Aruna #Dinamina #Ada #TheMorning #DailyMirror #TVDerana #Swarnawahini #ITN #Hiru**